# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 12,101—1960 අප්‍රේල් 7 වැනි බ්‍රහස්පතින්ද—7.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

අංක 144 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (iv) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව, මෙහි පෙනෙන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වරායවල හෝ ස්ථානවල රේගුවෙන් හාල්, වී, තිරිඟු, තිරිඟු පිටි හෝ කුරක්කන්, එම උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් පුද්ගලයාගෙන් හෝ (කාරණයට අදාල පරිදි) පුද්ගලයස්ගෙන් අයෙකුගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ හා එම පුද්ගලයා විසින් කරනු ලබන ගෙන යායුතු කාලය, ආකාරය හා ස්ථානය පිළිබඳව නියෝගය යටතේත් මිස ගෙන යෑම ආහාර, වාණිජ සහ වෙළඳ ඇමති තැන්පත් මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, මෙම නියෝගයෙන් තහනම් කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ සහ වෙළඳ ඇමති.

1960 අප්‍රේල් මස 6 වෙනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| 1 වෙනි තීරය<br>වරාය හෝ ස්ථානය | 2 වෙනි තීරය<br>බලපත්‍ර නිකුත් කළ හැකි අය |
|---|---|
| කොළඹ ... ... ... | ආහාර පාලක තැන |
| ගාල්ල ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, ගාල්ල ; නියෝජ්‍ය ආහාර පාලක තැන, ගාලු දිස්ත්‍රික්කය |
| යාපනය, කන්කසන්තුරෙයි, කයිට්ස්, පේදුරුතුඩුව, වල්වෙඩිඩිතුරෙයි .. .. | ආණ්ඩුවේ ඒජන්ත, යාපනය ; නියෝජ්‍ය ආහාර පාලක තැන, යාපනේ දිස්ත්‍රික්කය |
| ත්‍රිකුණාමලය ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, ත්‍රිකුණාමලය ; නියෝජ්‍ය ආහාර පාලක තැන, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය |
| තලෙයිමන්නාරම, මන්නාරම ... ... | ආණ්ඩුවේ ඒජන්ත, මන්නාරම ; නියෝජ්‍ය ආහාර පාලක තැන, මන්නාරම් දිස්ත්‍රික්කය |
| මඩකලපුව ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, මඩකලපුව ; නියෝජ්‍ය ආහාර පාලක තැන, මඩකලපු දිස්ත්‍රික්කය |
| බේරුවල, කළුතර ... ... | ආණ්ඩුවේ ඒජන්ත, කළුතර ; නියෝජ්‍ය ආහාර පාලක තැන, කළුතර දිස්ත්‍රික්කය |
| මුලතිව් ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, වව්නියා ; නියෝජ්‍ය ආහාර පාලක තැන, වව්නියා දිස්ත්‍රික්කය |
| පුත්තලම, කල්පිටිය ... ... | ආණ්ඩුවේ ඒජන්ත, පුත්තලම ; නියෝජ්‍ය ආහාර පාලක තැන, පුත්තලම් දිස්ත්‍රික්කය |
| මීගමුව ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, කොළඹ ; නියෝජ්‍ය ආහාර පාලක තැන, කොළඹ දිස්ත්‍රික්කය |

405—ජේ. ඇන්. ආර් 9136—4,700 (4/60)

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

### අංක 145 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (v) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව ආහාර, වාණිජ සහ වෙළෙඳ ඇමති තැන්පත් මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, මේ නියෝගයෙන් මෙහි පෙනෙන උපලේඛනයේ සඳහන් ධාන්‍යාගාරයේ පාලනය භාර ගනිමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ සහ වෙළෙඳ ඇමති.

1960 අප්‍රේල් මස 6 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

වාමර්ස් ධාන්‍යාගාරය, කොළඹ

---

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

### අංක 146 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (vi) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව, මෙදින සිට ලංකාවේ සෑම කොටසකම වෙළඳුන්ට සහ ඔබද හරින්නන්ට වී, වෙනත් ධාන්‍ය වර්ග හෝ එවැනි ධාන්‍ය වර්ග වලින් නැතහොත් එම ධාන්‍ය වර්ග මූලිකව අන්තර්ගතව සකස් කළ ද කොටස් කර දීමට විධි විධාන සැළසීමට හා එම ද්‍රව්‍ය සලාක ක්‍රමයක් සංවිධානය කොට පරිපාලනය කිරීමට ආහාර, වාණිජ සහ වෙළඳ ඇමති තැන්පත් මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, ආහාර පාලක තැනට මේ නියෝගයෙන් නියම කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ සහ වෙළෙඳ ඇමති.

1960 අප්‍රේල් මස 6 වෙනි දින,
කොළඹ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.